C 332 APS

# "ශ්‍රී ලංකාවේ ඉතිරි කිරීම් මත මූල්‍ය ප්‍රතිසංස්කරණ වල බලපෑම (1977-1994)"

# "The Impact of the Financial Reforms on Savings in Sri Lanka (1977-1994)"

ඩබ්ලිව්.පී. ආරියදාස

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

මෙම ස්වාධීන නිබන්ධනය ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දර්ශණපති උපාධිය (ආර්ථික විද්‍යාව) සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි.

ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පේරාදෙණිය

533228

# සංක්ෂිප්තය

මෙම පර්යේෂණාත්මක නිබන්ධනය මගින් ශ්‍රී ලංකාවේ ඉතිරි කිරීම් කෙරෙහි 1977-1994 කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක වූ මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ කවරාකාර බලපෑමක් කර ඇති ද යන්න පිළිබඳව විශ්ලේෂණය කෙරේ. 1977 වර්ෂයේදී අන්තර් ජාතික මූල්‍ය අරමුදල (IMF) හා ලෝක බැංකුව (WB) මගින් ඉදිරිපත් කරන ලද ව්‍යුහාත්මක ගළපාලීමේ වැඩසටහනක් ද සහිතව ආර්ථික ප්‍රතිපත්ති යෝජනාවලියක් ශ්‍රී ලංකාවේ ද ක්‍රියාත්මක කරන ලදි. හඳුන්වාදෙන ලද මෙම නව ආර්ථික ප්‍රතිපත්ති යෝජනාවලිය තුළ මූල්‍ය ක්ෂේත්‍රයේද වැදගත් ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක විය. විශේෂයෙන්ම, පොළී අනුපාතික ලිහිල්කරණය හා මූල්‍ය අතරමැදිකරණ කටයුතු සංවර්ධනය කිරීම මෙහිදී කැපී පෙනුනි.

පොළී අනුපාතික ලිහිල්කරණය මගින් ආර්ථිකයේ මූල්‍ය ඉතිරි කිරීම් ඉහළ නංවා ඒ මගින් ආයෝජනය ශක්තිමත් කිරීම අරමුණු ලදි. මේ යටතේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව ප්‍රමුඛව වානිජ බැංකු ඇතුළු අනෙකුත් තැන්පතු බාර ගන්නා මූල්‍ය ආයතන තම තැන්පතු අනුපාතිකයන් ඉහළ නංවන ලදි. මූල්‍ය අතරමැදිකරණය දියුණු කිරීම සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක ලෙස නව ආයතන හා මූල්‍ය උපකරණ හඳුන්වා දෙන ලදි.

පර්යේෂණයේ ප්‍රතිඵලවලට අනුව, තැන්පතු මත පොළී අනුපාතිකයන් ඉහළ නැංවීමේ ක්‍රියාවලිය යටතේ ආයතනික මූල්‍ය ඉතිරි කිරීම් සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් ඇතිමුත්, සමස්ථ දේශීය ඉතිරි කිරීම් ඉහළ නැංවීම කෙරෙහි එය සාර්ථක වීමක් දක්නට නැත. අනෙක් අතට, නව මූල්‍ය ආයතනවල බිහිවීමක් හා පැවැති මූල්‍ය ආයතනවල කැපී පෙනෙන සංවර්ධනයක් දක්නට ලැබුණද ආර්ථිකයේ ඉතිරි කිරීම් වෘද්ධිය කෙරෙහි එයින් බලපෑමක් නොවේ.

මූල්‍ය ඉතිරි කිරීම් ආදර්ශයේ ප්‍රතිඵලවලට අනුව, සලකා බලන ලද විවරණ විචල්‍යයන් අතරින් අපනයන ආදායම්, පෞද්ගලික සංක්‍රාම ගෙවීම් (ශුද්ධ) හා පසුගිය වර්ෂයේ මූල්‍ය ඉතුරුම් 5% මට්ටමේදී සංඛ්‍යානාත්මක වශයෙන් වෙසෙසි විය. එහෙත් දේශිය ඉතිරි කිරීම් පිළිබඳ ආදර්ශයේදී මෙම කිසිම විචල්‍යයක් වෙසෙසි නොවීය.